# පරීක්ෂක වාර්තාව

AA1 විභාගය - ජනවාරි 2016

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

---

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. එහෙත් සමහර අයදුම්කරුවන් සාධනීය ලකුණු මට්ටමට ළඟා වී නොතිබුණු අතර ඒ සඳහා පොදුවේ බලපා තිබූ හේතු කිහිපයක් පහත පරිදි හඳුනා ගන්නා ලදි:

## A - කොටස

**ප්‍රශ්න අංක 01** - ලකුණු 40 (ලකුණු 02 බැගින් බහුවරණ ප්‍රශ්න 20)

මෙම ප්‍රශ්නය සකස් වී තිබුණේ සමස්ථ විෂය නිර්දේශය ආවරණය වන ආකාරයට ය. එසේම, අයදුම්කරුවන්ට විෂය නිර්දේශය පිළිබඳ ඔවුන්ගේ දැනුම භාවිතයෙන් උපරිම ලකුණු ප්‍රමාණයක් අත්කර ගැනීමට හැකිවන ලෙස ය.

සමස්තයක් ලෙස ගත්කල මෙම ප්‍රශ්නය සඳහා බොහෝ අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාර්ථකව උත්තර ලියා ලකුණු ලබාගෙන තිබුණි.

ප්‍රශ්න අංක 1.11 සිට 1.15 දක්වා සත්‍ය හෝ අසත්‍ය බව සඳහන් කිරීමට උපදෙස් දී තිබුණ ද ඒ වෙනුවට "✓" හා "X" ලෙස උත්තර ලියා තිබුණි.

කෙසේ නමුත් මෙම ප්‍රශ්නය සඳහා උත්තර සැපයීමට අයදුම්කරුවන් සියල්ලම පාහේ ඉදිරිපත්ව තිබූ අතර වැඩිදෙනෙකු මුළු ලකුණු ලබා ගැනීමට ද සමත් විය.

## B කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න 4 කින් සමන්විත විය.

**ප්‍රශ්න අංක 02** - ලකුණු 10

(a) ආර්ථික විද්‍යාවේ මූලික සංකල්පයක් වන ආර්ථික සම්පත් යන්න පිළිබඳ දැනුම හා අවබෝධය මෙම ප්‍රශ්නය මඟින් විමසන ලදී. මෙම ප්‍රශ්නය සඳහා බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. කෙසේවෙතත් සමහර උත්තර වල ආර්ථික සම්පත් සඳහා උදාහරණ ලෙස ශ්‍රමය, භූමිය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය යන්න නම් කිරීම වෙනුවට වෙනත් යම් යම් උදාහරණ දක්වා තිබුණි.

උදා:- කර්මාන්ත ශාලා, වගාබිම් ආදිය

(b) ආවස්ථික පිරිවැය හා ගිණුම්කරණ පිරිවැය අතර වෙනස හඳුනාගැනීමේදී බොහෝ අයදුම්කරුවන් ආවස්ථික පිරිවැය නිවැරදිව නිර්වචනය කර තිබූ බව දක්නට ලැබුණි. කෙසේවෙතත් ගිණුම්කරණ පිරිවැය නිවැරදිව අර්ථ දැක්වීමට සමහර අයදුම්කරුවන් අසමත්ව තිබුණි. නිදසුන් දැක්වීමේදී ද ආවස්ථික පිරිවැය සඳහා නිවැරදි උදාහරණ සපයා තිබූ අතර ගිණුම්කරණ පිරිවැය සඳහා නිවැරදිව උදාහරණ දැක්වීමට ද අයදුම්කරුවන් බහුතරයක් අපොහොසත් වී තිබුණි.

## ප්‍රශ්න අංක **03** - ලකුණු 10

(a) වෙළෙඳපොල සමතුලිතය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම මෙම ප්‍රශ්නය මගින් අපේක්ෂා කර ඇත. මේ සඳහා බහුතරයක් අයදුම්කරුවන් ප්‍රස්තාර ඇඳ තිබූ නමුත් ඔවුන්ගෙන් වැඩි දෙනෙකුගේ උත්තර නිවැරදි නොවීය. ප්‍රස්තාර ඇඳීමේදී දක්නට ලැබුණු පොදු දුර්වලතාවයන් අතර,

- ප්‍රස්තාරයන්හි අක්ෂ නම් නොකිරීම (ප්‍රමාණය, මිල).
- ඉල්ලුම් සැපයුම් ප්‍රස්තාර නම් කර නොතිබීම.
- සමතුලිත ලක්ෂය නම්කර නොතිබීම.
- අධි සැපයුම හා අධි ඉල්ලුම නම්කර නොතිබීම.

යනාදි කරුණු වලින් එකක් හෝ කිහිපයක් දක්නට ලැබුණි. එසේම ප්‍රස්තාර ඇසුරින් කරන ලද විස්තරයන් ද ප්‍රමාණවත් සහ නිවැරදි නොවීය.

(b) මෙම ප්‍රශ්නය බොහෝ අයදුම්කරුවන් නිවැරදිව අවබෝධ කරගෙන නොතිබූ බව පෙනුණි. බොහෝ උත්තර වල දක්නට ලැබුණේ ඉල්ලුම් සැපයුම් සංකල්පයන් පිළිබඳ හැඳින්වීමක් පමණි.

උදා:- ඉල්ලුම කෙරෙහි බලපාන සාධක හඳුන්වාදීම,

සැපයුම කෙරෙහි බලපාන සාධක නම්කර තිබීම, ආදිය

දැක්විය හැකිය.

## ප්‍රශ්න අංක **04** - ලකුණු 10

(a) එක් එක් වෙළෙඳපොල ව්‍යුහයන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලදි. ඒකාධිකාරී තරඟයේ වෙළෙඳපොළක ලක්ෂණ පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන සරල ප්‍රශ්නයක් වූ මෙයට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි.

එසේ වුවද අසාර්ථක ලෙස සැපයූ උත්තර ද දක්නට ලැබුණු අතර,

- ඒකාධිකාරී තරඟය පිළිබඳ නිසි අවබෝධයකින් තොරව ඒකාධිකාරී වෙළෙඳපොළෙහි ලක්ෂණ දක්වා තිබුණි.
- කිසිදු පදනමකින් තොරව වෙනත් වෙළෙඳපොලයන්හි ලක්ෂණ දක්වා තිබුණි.
- සෑම වෙළෙඳපොලකම ලක්ෂණ පදනමකින් තොරව උත්තර ලෙස ලියා තිබුණි.

(b) මුදලට ඇති ඉල්ලුම කෙරෙහි බලපාන චේතනා 3 පිළිබඳ දැනුම හා අවබෝධය මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදි. මේ සඳහා බොහෝ අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. එසේ වුවද සැලකිය යුතු ප්‍රමාණයක් වැරදි පිළිතුරු දක්වා තිබූ අතර එම අඩුපාඩු පහත පරිදි වේ:

- ගනුදෙනු, ආරක්ෂණ, සමපේක්ෂණ යනුවෙන් චේතනා 3 නිවැරදිව නම්කර තිබුණ ද ඒවා පිළිබඳ විස්තර දක්වා නොතිබීම.
- ඇතැම් අවස්ථාවන්හිදී ගනුදෙනු චේතනාව යන්නට ආරක්ෂණ චේතනාවත් ආරක්ෂණ චේතනාව යන්නට ගනුදෙනු චේතනාවට අදාල කරුණුත් වශයෙන් කරුණු මාරුකර දක්වා තිබුණි.

## ප්‍රශ්න අංක **05** - ලකුණු 10

(a) අයවැය ලේඛනයේ ප්‍රධාන අරමුණු බොහෝ අයදුම්කරුවන්ට නිවැරදිව තෝරා බේරා ගැනීමට නොහැකි වූ බව දක්නට ලැබුණි. බොහෝ අසාර්ථක උත්තර වල දක්නට ලැබුණු දුර්වලතා අතර අයවැයෙහි අරමුණු ලෙස සහනාධාර ලබා දීම, බදු ආදායම් ලබා ගැනීම, ආනයන බදු පැනවීම, ණය ලබා ගැනීම යනාදී කරුණු දක්වා තිබීම, දැක්විය හැකිය.

(b) රජය විසින් අවම මිලක් පැනවීමේ ප්‍රතිවිපාක පිළිබඳව අයදුම්කරුවන්ගේ අවබෝධය මැන බැලීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන ලදි. බහුතරයක් අයදුම්කරුවන් සාර්ථක ලෙස නිවැරදි උත්තර සැපයීමට අපොහොසත් විය. ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර නොගැනීමට ප්‍රධාන වශයෙන්ම බලපා තිබුණේ අවම මිල සහ උපරිම මිල යන සංකල්ප දෙක අතර ඇති වෙනස නිවැරදිව හඳුනා ගැනීමට අසමත්වීමය.

උදා:- අවම මිල පැනවීම හේතුවෙන් සැපයුම්කරු අධෛර්යමත් වී සැපයුම අඩු කරන බවත් එමගින් පාරිභෝගිකයාට වාසිදායක වන බවත් දක්වා තිබුණි.

## C කොටස

**ප්‍රශ්න අංක 06** - ලකුණු 20

(a) (i) ජාතික ගිණුම් සංකල්පය පිළිබඳ ප්‍රයෝගික අවබෝධය මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබුණි. මේ සඳහා බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

(ii) ජාතික ගිණුම්වල සීමාවන් ද බොහෝ අයදුම්කරුවන් නිවැරදිව දක්වා තිබුණි. අසාර්ථක පිළිතුරු වලට හේතු වී තිබුණේ ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කරගෙන නොතිබීමයි.

(b) (i) ජාතික ගිණුම් ගණනය කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ අවබෝධය පරීක්ෂා කර තිබුණි. .

(ii) දෙන ලද ප්‍රශ්නය ඇසුරින් සාධක පිරිවැය මිලට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම සඳහා ප්‍රශ්නය යොමු කර තිබුණි. කෙසේවෙතත් බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව මෙය ගණනය කර නොතිබූ බව දක්නට ලැබුණි. ජාතික ගිණුම් ගණනය සම්බන්ධයෙන් වන සංකල්ප පිළිබඳ නිසි අවබෝධයකින් තොරව උත්තර සැපයූ බව දී තිබූ උත්තර වලින් දක්නට ලැබුණි.

(c) උද්ධමනය පිළිබඳ අවබෝධය මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබුණි. මෙහිදී ඉල්ලුමෙන් ලැබුණ උද්ධමනය හා පිරිවැයෙන් තල්ලුවුනු උද්ධමනය පිළිබඳ වෙනස ප්‍රස්තාර ඇසුරින් පැහැදිලි කිරීම පිළිබඳව විමසා තිබුණි. මෙම ප්‍රශ්නයට නිවැරදිව පිළිතුරු සපයා තිබුණේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකි. මෙම සංකල්පය පිළිබඳව අයදුම්කරුවන්ගේ අවබෝධය ප්‍රමාණවත් නොවන බව දී තිබූ උත්තර වලින් මනාව පැහැදිලි විය.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.
2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති පිළිතුර පිළිබඳව නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.
3. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, මහ බැංකු වාර්තා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.
4. ප්‍රස්තාර හරියාකාරව නම් කිරීම හා පැහැදිලි කිරීම.
5. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.
6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.
7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.
9. ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.
10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.
11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.
12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -